**බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**කරුණක් අවධාරණය කිරීම**

මාගේ මතය තත්වාගණනය කිරීමකින් තොරව, පහත සඳහන් කරුණු විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශනයන්හි 2.5 සටහන වෙත අවධානය යොමු කරමි;

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2017 වර්ෂයේදී සමාගම ඈවර කළ යුතු යැයි යෝජනා සම්මත කර තිබුනද, 2021 පෙබරවාරි 08 වන දින පැවති ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත අනුමැතීන් ලබා දී ඇත;

- බැංකුවේ අක්‍රීය ණය කළමනාකරණය කිරීම සඳහා බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම ණය අය කර ගැනීමේ සේවා සපයන්නා බවට පරිවර්තනය කිරීම.

- 1988 අංක 30 දරණ බැංකු පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම ණය අය කර ගැනීමේ සේවා සපයන්නා බවට පරිවර්තනය කිරීමේ යෝජනාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ (සීබීඑස්එල්) මුදල් මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම.

- පහත සඳහන් වගන්තිය ඇතුළත් කිරීම මඟින් සාංගමික සංස්ථාපත්‍රය සංශෝධනය කිරීම සඳහා බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් විශේෂ යෝජනාවක් සම්මත කිරීම.

"මූල්‍ය ආයතන සඳහා ණය අය කර ගැනීමේ නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම සහ සෑම ආකාරයකම හා විස්තරාත්මක ණය අය කර ගැනීමේ සේවා සැපයීම"

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,සමාගම ක්‍රියා කර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2017 වර්ෂයේදී සමාගම අනාගතයේදී ඈවර කළ යුතු යැයි යෝජනා සම්මත කර තිබුනද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතියට යටත්ව බැංකුවේ අක්‍රීය ණය අය කර ගැනීමේ සේවා නියෝජිතයා බවට පත් කර ගැනීම සඳහා 2021 පෙබරවාරි 08 වන දින පැවති ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී යෝජනා සම්මත කර ගෙන ඇත. කෙසේ වෙතත් යෝජිත සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වෙනස් කිරීමේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය 2021 සිට අපේක්ෂාවෙන් පවතී. | පසුකාලීනව ලංකා බැංකුව (බීඕසී) සහ ශ්‍රී ලංකා මහබැංකුව (සීබීඑස්එල්) අතර ඇති ඊමේල් ලිපි හුවමාරුව සලකා බැලීමේදී, වෙනම අනුබද්ධිත ආයතනයක් පිහිටුවීම වෙනුවට ණය ආපසු අයකර ගැනීම සෘජුවම බාහිරින් ලබා ගැනීමේ හැකියාව ලංකා බැංකුවට ඇති බව ශ්‍රී ලංකා මහබැංකුව දැනුම් දී ඇත. එබැවින්, සමාගම ණය අයකර ගැනීමේ සේවා සපයන්නා බවට පරිවර්තනය කිරීමේ යෝජනාව ශක්‍ය නොවිය හැකිය. | සමාගම ණය අයකර ගැනීමේ සමාගමක් බවට පරිවර්තනය කිරීමේ යෝජනාව ශක්‍ය නොවන්නේ නම් සමාගම ඈවර කිරීමට නිර්දේශ කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 29,083 ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු.47,690 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අලාභයෙහි රු. 18,607 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය තුළදී සමාගම මෙහෙයුම් ආදායමක් උපයා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ආයතන හා පරිපාලන වියදම් ලෙස සමාගම රු.29,083 ක වියදමක් දරා ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මූලික ව්‍යාපාරික කටයුත්ත වන්නේ ලංකා බැංකුවේ මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා සේවකයින් බඳවා ගැනීම වේ. නමුත් සමාගම 2007 වර්ෂයේ සිට අදාල ව්‍යාපාරික කටයුත්තෙහි නිරත වී නොතිබුණි. | ලංකා බැංකුවේ නියමය පරිදි 2007 වර්ෂයේදී සමාගම විසින් ව්‍යාපාර මෙහෙයුම් නතර කරන ලදී. | සමාගම 2007 වර්ෂයේ සිට එහි මූලික ව්‍යාපාරික කටයුත්තු වල නිරත නොවන හෙයින් සමාගම ඈවර කිරීමට නිර්දේශ කරනු ලැබේ. |